# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.01.22 පැය 1900 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/122 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පවතින අයහපත් කාලගුණ තත්වය හේතුවෙන් මහනුවර මහියංගනය මාගර්ය තාවකාලිකව වසා දැමීම.**

පවතින අයහපත් කාලගුණ තත්වය හේතුවෙන් මහනුවර මහියංගනය ප්‍රධාන මාගර්යට උඩදුම්බර පොලිස් වසමේ කහටගොල්ල ප්‍රදේශයෙන් පස් කඳු හා ගල් කඩා වැටීමේ අවධානම් තත්ත්වයක් පවතින බැවින් ඒ සම්බන්ධව මහනුවර දිස්ත්‍රික් ලේකම් කායර්ාලයේදී දිස්ත්‍රික් ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් ගොඩනැඟිලි පයෙර්ෂණ නායයාම් හා අවධානම් කළමනාකරණ මහනුවර කායර්ාලයේ නිලධාරීන්, මාගර් සංවධර්න අධිකාරියේ නිලධාරීන්, උඩදුම්බර ප්‍රාදේශීය ලේකම්, තෙල්දෙණිය කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී හා උඩදුම්බර පොලිස් ස්ථානාධිපති යන අයවලුන් විසින් 2025.01.21 වන දින විශේෂ සාකච්ඡාවක් පවත්වන ලදී.

ඒ අනුව මෙම මාගර්යේ රාත්‍රී කාලයේ ගමන් ගන්නා වාහන හා පුද්ගලයින් හට බරපතල අනතුරු සිදුවිය හැකි බැවින් **2025.01.22 වන අද දින සවස 0600 සිට 2025.01.23 වන දින උදෑසන 0600 දක්වා කාලය තුල මහනුවර මහියංගනය ප්‍රධාන මාගර්ය මහනුවර පොලිස් වසමේ තැන්නේකුඹුර හන්දියෙන් හා හසලක පොලිස් වසමේ පාලම් හන්දියෙන්** වසා දැමීමට කටයුතු කර ඇත.

**විකල්ප මාගර් -**

- මහනුවර දෙස සිට මහියංගනය දෙසට ධාවනය වන **බර වාහන** තැන්නේකුඹුර හන්දියෙන් රජ මාවත දෙසට හා මහියංගනය දෙස සිට මහනුවර දෙසට ධාවනය වන බර වාහන හසලක පොලිස් වසමේ පාලම් හන්දියෙන් රන්දෙනිගල මාගර්ය දෙසටත් විකල්ප මාගර් ලෙස භාවිතා කළ හැක.

- එමෙන්ම මහනුවර දෙස සිට මහියංගනය දෙසට ගමන් ගන්නා **සැහැල්ලු වාහන වලට පමණක්** උඩදුම්බර පොලිස් වසමේ එනමල්පොත හන්දියෙන් උඩුදුම්බර නගරයටත්, මහියංගනය දෙස සිට මහනුවර දෙසට ධාවනය වන **සැහැල්ලු වාහන** උඩදුම්බර නගරයෙන් එනමල්පොත හන්දිය දක්වාත් විකල්ප මාගර් ලෙස භාවිතා කළ හැක.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**